


***ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) වන අපි, විශිෂ්ටත්වය සඳහා විශිෂ්ටයින් බඳවා ගන්නා සහ සියලු දෙනාට සමාන රැකියා අවස්ථා ලබාදෙන සේවායෝජකයෙක් වන්නෙමු.***

***මෙම සමාගමේ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (JIA) සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලානෙහි (CIAR)) පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.***

**ගුවන් යානා කාර්මික ශිල්පී තනතුර** (POST OF AIRCRAFT TECHNICIAN)

**රැකියාවේ ස්වභාවය** : සේවාදායක ගුවන් සමාගමේ බලයලත් ඉංජිනේරුවරයාගේ/ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරයාගේ (AME) උපදෙස් සහ අධීක්ෂණය යටතේ, ගුවන් යානා මෙහෙයවීමේ (marshaling) කටයුතු සිදු කිරීම මෙන්ම එම ගුවන් සමාගම් වෙත මූලික මට්ටමේ ගුවන් යානා නඩත්තු සේවා සහ තාක්ෂණික සහාය ලබා දීම. මෙහි දී, පැවරී ඇති නඩත්තු සහ සේවා කටයුතු ආරක්ෂිතව, කාර්යක්ෂමව සහ අදාළ නඩත්තු ක්‍රියා පටිපාටි, රෙගුලාසි මෙන්ම සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා)(පෞද්ගලික) සමාගමෙහි අවශ්‍යතාවන්ට අනුකූලව සිදු කිරීම තහවුරු කළ යුතු ය. මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමේදී ගුවන් තොටුපළ අංගන මෙහෙයුම් භාර අධීක්ෂක (Ground Handling Superintendent – Ramp Operations) වෙත සෘජුවම වාර්තා කළ යුතු ය.

**රැකියාවේ වගකීම් :**

i. නියමිත ගුවන් යානා නැවතුම් ස්ථාන හා ගුවන් පථ වෙත නිවැරදිව පෙළගස්වමින් ගුවන් යානා වෙත හා ආපසු මඟින් ගෙන යාම්, හැරවීම්, නතර කිරීම්, එන්ජිම ක්‍රියා විරහිත කිරීම් සහ නැවැත්වීම් අතරතුර දී නියමුවන්ට ගුවන් යානා හැසිරවීම මඟින් ආරක්ෂිතව මඟ පෙන්වීම.

ii. ආරක්ෂිත මෙහෙයුම් පරිසරයක් සහතික කිරීම සඳහා සෑම ගුවන් යානයක්ම පැමිණීමට සහ පිටත්වීමට පෙර, සෑම ගුවන් යානා දොරටුවකදීම සහ ගුවන් යානා නවත්වා ඇති ස්ථානවල දී (Hard Standing) ආගන්තුක ද්‍රව්‍ය/සුන්බුන් (FOD) පරීක්ෂාව සිදු කිරීම.

iii. ගුවන් ගමන් ආරක්ෂිතව හා කාලෝචිතව සිදු කිරීමට සහාය වීම සඳහා සමාගම් ක්‍රියාපටිපාටි සහ පාරිභෝගික ගුවන් සේවයේ මාර්ගෝපදේශ අනුව නිවැරදි ඉන්ධන වර්ගය තෝරාගෙන ගුවන් යානයට ඉන්ධන පිරවීම.

iv. දැන් භාවිතයෙන් තොරව සන්නිවේදනය කළ හැකි හෙඩ්සෙට් භාවිත කරමින් බාධාවීමකින් තොරව නඩත්තු හා මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා ආරක්ෂිතව සම්බන්ධීකරණය කිරීම.

v ගුවන් මෙහෙයුම් සිදුවන පාලක පර්යන්ත, දියර මට්ටම්, ටයර්, බ්‍රේක් සහ සෙසු වැදගත් ගුවන් යානා කොටස් පරීක්ෂා කර ගුවන් යානය ගුවන් ගමනට සුදුසු තත්ත්වයේ ඇති බව සහතික කිරීමට නියමිත කාලසටහන් හා ක්‍රියාපටිපාටි අනුව ගුවන් ගමනට පූර්වයෙන් සහ පසුව පරීක්ෂා කිරීම් සිදු කිරීම.

vi පාරිභෝගික ගුවන් සේවයේ බිම් මට්ටමේ ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය යටතේ, රේඛීය නඩත්තු කිරීම් අතරතුරදී දෝෂ සහිත කොටස් අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සහ ක්‍රියාකාරී පරීක්ෂණ සිදු කිරීම ඇතුළුව ගුවන් යානා පද්ධති, එන්ජින්, ගුවන් යානා සහ අනෙකුත් සංරචකවල තාක්ෂණික ගැටලු හෝ අක්‍රමිකතා හඳුනා ගැනීම, දෝශ නිරාකරණය කිරීම සහ විසඳීම.

vii ආරක්ෂක උපකරණ නිවැරදිව භාවිත කිරීම, තීරණාත්මක ක්‍රියාපටිපාටි (LOTO) සහ විදුලි ආරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම ඇතුළුව පෞද්ගලික ආරක්ෂාව, ගුවන් යානය, කාර්ය මණ්ඩලය සහ මගීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සියලුම ආරක්ෂක ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම.

viii සොයාගත් දෝෂ වාර්තා කිරීම, අලුත්වැඩියා කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ගුවන් යානයේ සූදානම් තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබාදීම සඳහා නඩත්තු කාර්ය මණ්ඩලය, ගුවන් යානා කාර්ය මණ්ඩලය සහ අනෙකුත් අදාළ පාර්ශ්ව සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම.

xi ගුවන් යානා නිසි පරිදි නඩත්තු කරන බවටත්, ගුවන් ගමන් සඳහා ක්‍රියාත්මක කිරීමට ආරක්ෂිත බවටත් සහතික වීම සහ ආරක්ෂිත හා කාර්යක්ෂම ගුවන් ගමනකට සහාය දෙන අදාළ නියාමන හා මෙහෙයුම් ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන් අනුකූල වන බව සහතික කිරීම.

x මෙහෙයුම් අවශ්‍යතා අනුව අධීක්ෂණ නිලධාරීන් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

1. **සුදුසුකම් :** i අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතු ය.

සහ

ii පිළිගත් ගුවන් යානා පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිලිබඳ වෘත්තීය හෝ තෘතීයික සුදුසුකම් ලබා තිබිය යුතුය.

2. **පළපුරුද්ද :** i අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වර්ෂ දෙකක (02) පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.

නවීන ජෙට් ගුවන් යානා සම්බන්ධ වාණිජ ගුවන් ප්‍රවාහනය සම්බන්ධ නඩත්තු මෙහෙයුම් පිළිබඳව පළපුරුද්ද ඇති පුද්ගලයන් සඳහා විශේෂ අවධානයක් සහ මූලිකත්වයක් ලබා දෙනු ඇත.

3. **වයස :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

4. **වැටුප** : තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ආකර්ෂණීය වැටුපක් හිමිවන අතර, එසේම ආකර්ෂණීය අමතර වරප්‍රසාද ද හිමි වේ.

5. **බඳවා ගැනීමේ ක්‍රමය** : සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**<u>පොදු කරුණු</u>**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (JIA) සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන (CIAR) යන ගුවන් තොටුපළවලට අමතරව, සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කළ යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් සමාගමේ වෙබ් අඩවියේ **http://www.airport.lk>Corporate>Careers** ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කළ අයදුම්පතක්, අදාළ සහතිකවල පිටපත් සමඟ පහත සඳහන් ලිපිනයට **<u>ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාවක් මඟින්</u>** යොමු කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ ඉහත සඳහන් මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනයන්හි සඳහන් කරුණු පිළිබඳ අපැහැදිලිතාවයක් ඇති වුවහොත් ඉංග්‍රීසි දැන්වීමේ කරුණු බලපැවැත්වෙන බව කරුණාවෙන් සළකන්න.

---

**සභාපති**
**ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා)(පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ**
**කටුනායක**

**දැන්වීම.** 16/08/2026